www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ උතුරට යුද්ධය පැතිරෙයි

## War spreads to the north of Sri Lanka

**සරත් කුමාර විසිනි**
**2006 අගෝස්තු 14**

ශ්‍රී ලංකාවේ මිලිටරිය සහ දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර කෙරෙන සටන් පසුගිය සති අන්තයේදී තීව්‍ර වූ අතර 200ක් තරම් විශාල මිනිස් ජීවිත ගනනක් බිලි ගනිමින් එය උතුරු යාපන අර්ධද්වීපය දක්වා ව්‍යාප්ත විය. එක් පාර්ශ්වයක් හෝ 2002 සටන් විරාමයෙන් විධිමත්ව ඉවත් වී නොමැති අතර. ගිවිසුම අවලංගු ලියැවිල්ලක් බවට පත්ව ඇත. දිවයින පූර්න පරිමාන සිවිල් යුද්ධයක් කරා යලි වේගයෙන් තල්ලු වෙමින් පවතී.

පසුගිය සිකුරාදා එල්ටීටීඊය විසින් මිලිටරියේ ප්‍රධාන ස්ථානවලට ඒකාබද්ධ ප්‍රහාරයක් දියත් කල අතර මෙයට යාපන අර්ධද්වීපයේ උතුරේ පිහිටි පලාලි ගුවන් කඳවුරට එක දිගට එල්ල කල කාල තුවක්කු ප්‍රහාරයක් ද අන්තර්ගත වේ. එල්ටීටීඊය මගින් පාලිත ප්‍රදේශය හරහා දිවයිනේ දකුන දක්වා දිවෙන මාර්ගයන් සම්බන්ධ වන ස්ථානයක පිහිටි මෙම කඳවුරු පහසුකම එම ප්‍රදේශයේ රඳවා ඇති ආරක්ෂක හමුදාවන්ට තීරනාත්මක ආධාරකයක්වූ අතර දැන් එම මාර්ග මුලුමනින්ම වැසී ඇත.

හමුදාවට අයත් බෙල් 212 හෙලිකොප්ටරයකට සහ ධාවන පථයට හානි සිදුවීම හේතුවෙන් සියලු හමුදා සහ වානිජ ගුවන් ගමන් නවතා දැමීමට සිදුවූ අතර එම සංකීර්නය තුලම පිහිටුවා තිබූ ආරක්ෂක හමුදා මූලස්ථානයට කිලෝ මීටර් 30 ක් පමන වූ දුරක සිට දිගු-දුර කාල තුවක්කු ප්‍රහාර එල්ල විය. පාබල හමුදාවන් බල ගැන්වීමට කොමාන්ඩෝ භටයින් ප්‍රවාහනය කිරීමේදී හමුදා හෙලිකොප්ටර් මත යැපෙන්නට හමුදාවට සිදුව තිබුනි.

එල්ටීටීඊය තමා විසින් 2000 දී අල්ලා ගත්, යාපන අර්ධද්වීපයට ඇතුලුවන දොරටුවක් ලෙස ක්‍රියාත්මක ප්‍රධාන මූලෝපායික ස්ථානයක් වන, අලිමංකඩ (එලිෆන්ට්පාස්) සිට උතුරු දෙසටද බලය තහවුරු කර ගත්තේය. එල්ටීටීඊ සටන්කරුවන් විසින් හමුදාවේ ඉදිරි බංකර ගනනාවක්ම අල්ලා ගැනින. සටන් විරාම නිරීක්ෂන කමිටුවේ නියෝජිත රොබෑන් නිල්සන් රොයිටර් පුවත් සේවයට මෙසේ පැවැසීය: "ශ්‍රී ලංකා හමුදාවේ බංකර් දහයක් අල්ලා ගත් නමුදු පසුව ඉන් පහක් ආරක්ෂක හමුදාවන් විසින් නැවත අත් කර ගැනින..... ඔවුන් (එල්ටීටීඊය) මෙතෙකුදු (හමුදාවේ) ඉදිරි ආරක්ෂක රේඛාවන්හි සිට මීටර් 500 ක් ඇතුලතින් සිටී."

හමුදාවට අවශ්‍ය ආහාර සහ අනෙකුත් භාන්ඩ සැපයීමේදී හා සෙබලුන් නැව් මගින් ප්‍රවාහනය කිරීමේදී තීරනාත්මක සන්ධි ස්ථානයක් මෙන්ම ප්‍රධාන නාවික කඳවුරක් වන ත්‍රිකුනාමල වරායේ නැගෙනහිර කොටසට ද එල්ටීටීඊය සෙනසුරාදා උදයේ ෂෙල් ප්‍රහාර එල්ල කලේය. 2000 දී, යාපන අර්ධද්වීපය තුල දස දහස් ගනනක් සෙබලුන්ට මං අහුරා එල්ටීටීඊය විසින් දරුනු ඒකාබද්ධ ප්‍රහාරයක් එල්ල කල අවස්ථාවේ ශ්‍රී ලංකාවේ හමුදාව බලගතු ව්‍යසනයකට මුහුන දුනි. හමුදාවට අත් වන්නට තිබූ දැවැන්ත පරාජයක් වැලකී ගියේ ඉන්දියාව සහ ප්‍රධාන බලයන් මැදිහත් වී එල්ටීටීඊයට එහි ප්‍රහාරාත්මක එලැඹුම නතර කරන ලෙස යොදන ලද පීඩනය නිසා පමනකි.

යාපනය නගරය ආසන්න ස්ථානයන්හිදී එල්ටීටීඊය විසින් මුහුදේ සිට එල්ල කල ප්‍රහාරයක් වැ්රථ කල බැව් හමුදාව ප්‍රකාශ කලේය. ඉරිදා උදෑසන ප්‍රහාරක හෙලිකොප්ටර් යානා මගින් එල්ටීටීඊ යාත්‍රා ගනනාවකට පහර දුන් බැව් හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් අතුල ජයවර්දන පැවසීය. ඔහු තව දුරටත් කියා සිටියේ මේ වන විටත් හමුදා සෙබලුන් විසින් සිකුරාදා කයිට්ස් දූපතට කඩා වැදුනු එල්ටීටීඊ සටන්කරුවන් කන්ඩායමක් දඩයම් කරමින් සිටින බවයි.

සටනේදී මෙම දෙදින තුල මිය ගිය සංඛ්‍යාව පිලිබඳ තක්සේරු වාර්තාවන් අතර බොහෝ වෙනස්කම් පවතී. හමුදාව කියා සිටින්නේ සතුරන් 150 ක් මරා දැමූ බවත් තම හමුදාවේ පුද්ගලයින් 36 ක් මිය ගොස් 80 ක් තුවාල ලැබූ බවත්ය. එල්ටීටීඊයට අනුව මිය ගිය තම සටන්කරුවන්ගේ සංඛ්‍යාව 22කි.

යුද්ධයේ නවතම වටය සම්බන්ධයෙන් ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව එල්ටීටීඊයට නරුම ලෙස දොස් පවරා ඇත. ආන්ඩුවේ ප්‍රකාශක නිමල් සිරිපාල ද සිල්වා රජයට හිමි පුවත්පතක් වන සිළුමිණට පසුගිය ඉරිදා මෙසේ පැවසීය: " සටන් විරාමය උල්ලංඝනය කිරීමක් නොවන බවට ගිවිසුමේ සඳහන්

කෙරී ඇති පරිදි මහජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීමට සහ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට හමුදාමය පියවර ගත් බැව් ආන්ඩුව අවධාරනාත්මකව කියා ඇත."

යථාර්ථයේදී ගැටුමේ ඉහල නැග්ම වනාහි පසුගිය නොවැම්බරයේ දී රාජපක්ෂ යන්තමින් ජයගත් මොහොතේ සිට හමුදාව එහි අර්ධ-මිලිටරි සගයින් සමග එක්ව එල්ටීටීඊයට එල්ල කරන ලද ප්‍රකෝපකාරී ප්‍රහාරයන්ගේ සෘජු නිෂ්පාදිතයකි. වත්මන් සටන්, "මානුෂික හේතු මත" ගොවීන්ට ජලය සැපයීම සඳහා මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීමට ප්‍රහාරයක් එල්ල කරන ලෙස අන කරමින් ජූලි 26 වන දා ජනාධිපති ගත් තීන්දුවේ සෘජු ප්‍රතිඵලයකි. පසුගිය සතියේ එල්ටීටීඊය විසින් සොරොව්ව විවෘත කල පසුවද එල්ටීටීඊ ප්‍රදේශයන් අල්ලා ගනීම සඳහා හමුදාව තම මෙහෙයුම ඉදිරියටම ගෙන ගියේය. මෙය පැහැදිලිවම සටන් විරාමය උල්ලංඝනය කිරීමකි.

හමුදාවේ මෙහෙයුම් මාවිල්ආරු අවට ප්‍රදේශයට සීමාවී නොමැත. ත්‍රිකුනාමල වරායට දකුනෙන් පිහිටි සාම්පූර් ප්‍රදේශයද ඇතුලත් ප්‍රධාන එල්ටීටීඊ ස්ථානයන් ගනනාවකට බෝම්බ හෙලීම සඳහා හමුදාව මෙම ප්‍රහාරය කඩතුරාවක් කර ගත්තේය. නැගෙනහිර නගරයක් වන මඩකලපුවට ආසන්නව පිහිටි තම කඳවුරක් අල්ලා ගැනීමට විශේෂ කාර්ය සාධක බලකාය උත්සාහ දැරූ බවට එල්ටීටීඊය චෝදනා කලේය. කරුනා කන්ඩායම බිහිවීමට තුඩුදුන්, 2004 දී එල්ටීටීඊය තුල සිදුවූ ව්‍යසනකාරී දෙදරායාමේ වාසිය අත්පත් කර ගැනීම සඳහා හමුදාවේ ඉහල නිලධාරීහු දිගු කලෙක සිට මාන බැලූහ. විය හැකි පරිදි, යාපන අර්ධද්වීපය තුල පිහිටි හමුදාවේ දුර්වල ස්ථානයන්ට පහර එල්ල කිරීම මගින් එල්ටීටීඊය එකට එක සිදු කොට ඇත.

## සාකච්ජා නොමැත

දෙපාර්ශ්වයම ඉක්මනින් සටන් නොනැවත්වුව හොත් නෝර්වීජියානුවන් විසින් නායකත්වය දෙනු ලබන සටන් විරාම නිරීක්ෂකයිනට රට හැර යන ලෙස තමා විසින් නිර්දේශ කල බැව් සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රධානි උල්ෆ් හෙන්රික්සන් අද දින ඩේලි මිරර් පුවත්පතට පවසා ඇත. "මෙම කාර්යයෙන් අප ඉවත් කර ගැනීමට සලකා බලන ලෙස මම නොර්වේ රජයට නිර්දේශ කලා. මක්නිසාදයත්, පාර්ශ්වයන් විසින් එය යොදා ගනු නොලබන්නේනම් එය ක්‍රියාත්මකවීමේ අවශ්‍යතාවක් මට පේන්නෙ නෑ. ඉතින් පාර්ශ්වයන්ට අප අනවශ්‍යනම් සමහරවිට ජීවිත අවදානම සහිතව අප මෙහි සිටින්නේ ඇයි? ඔවුනට අප අවශ්‍ය වන්නේ දේශපාලනික ආවරනයක් සඳහා පමනයි." යනුවෙන් ඔහු පැවසීය.

මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීම සඳහා ආන්ඩුව එල්ල කල ප්‍රහාරය "මානුෂික" හෝ ආරක්ෂක මෙහෙයුමක් නොව "ප්‍රහාරයක්" බැව් තමා තීන්දු කල බැව් හෙන්රික්සන් පැවසීය. "මානුෂික මෙහෙයුමක් හෝ ආරක්ෂක ගුවන් ප්‍රහාරයක් ගැන ඔවුන් කතා කරනවා...සත්තකින්ම, ඔබ සටන් කරන්නේ සතුරා සමග බැවින් දැන් කෙරෙන සමස්ත මෙහෙයුම ආන්ඩුවට දැනෙන්නේ ආරක්ෂක මෙහෙයුමක් ලෙසයි. නමුත් ඒ පිලිබඳව මගේ අදහස එය නොවෙයි, අවම වශයෙන් එය සටන් විරාම ගිවිසුමට එකග නෑ."

වත්මන් සටන් මධ්‍යයේ, ආන්ඩුවේ සාම මහලේකම් කාර්යාලයේ ප්‍රධානි පාලිත කොහොන කියා සිටියේ සාකච්ඡාවන් පිලිබඳව එල්ටීටීඊයෙන් යෝජනාවක් ලැබුනු බවයි. කොහොන සැනෙකින් යෝජනාව වැලැඳ ගති-මෙය හමුදා ප්‍රහාරය සැලසුම් කල අයුරින් ඉදිරියට ගමන් නොකරන බවට ඉගි කෙරෙන වෙනසකි. සැනෙකින් මෙම ප්‍රකාශය හෙලා දකිමින් එල්ටීටීඊ සාම මහලේකම් කාර්යාලයේ ප්‍රධානි එස්.පුලිදේවන් මෙසේ පැවසීය. "අප සාම සාකච්ඡාවන් සඳහා යෝජනාවක් කලේ නෑ. ආන්ඩුවේ ප්‍රහාරයන් විසින් සාම සාකච්ඡාවන් කල නොහැක්කක් බවට පත් කලා."

ගැටුම් ඉහල නගිද්දී සහ සාමය පිලිබඳ දසුනක් නොපෙනෙන තතු යටතේ අවසානයේදී පසුගිය සිකුරාදා කොලඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය ප්‍රකාශයක් නිකුත් කරමින් සටන් නවත්වන ලෙසත් සාකච්ඡා නැවත අරඹන ලෙසත් කැඳවුම් කලේය. ආන්ඩුවේ ප්‍රහාරය දියත් කොට සති දෙකක් ගිය තැන ප්‍රථම වරට නිකුත් කල මෙම ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ හමුදාව දුෂ්කරතාවන්ට මුහුන දී ඇති බව සම්බන්ධයෙන් වොෂින්ටනයේ උත්සුකය පෙන්නුම් කෙරේ. පූර්වයෙන් පැවති නිශ්ශබ්දතාව රාජපක්ෂ ආන්ඩුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් බුෂ් පරිපාලනය-පෙනුමට කෙසේ වෙතත්- ඇත්ත වශයෙන් දල්වා ඇති කොල එලිය තව දුරටත් වර්ධනය කෙරින.

ඊට පසුදා සාම ක්‍රියාවලියේ සම සභාපතිත්වය - එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ විවෘත ගැටුම පුපුරා යාමෙන් පසු ප්‍රථම වරට ඔවුනගේ ප්‍රකාශයක් නිකුත් කලේය. සිය ගනනක් ජනයා මරා දමද්දී සහ තවත් දස දහස් ගනනක් තම නිවෙස් වලින් පලවා හරිද්දී නිහඬව අසුන් අරා සිටි මෙම සම සභාපතිත්වය සටන් සම්බන්ධයෙන් කුහක ලෙස තම තම ගැඹුරු කනස්සල්ල ප්‍රකාශ කොට සාකච්ඡා මේසයට ක්ෂනිකව නැවත පැමිනෙන ලෙස උපදෙස් දුනි.

කෙසේ නමුදු, ඒකාබද්ධ ජාත්‍යන්තර මැදිහත්වීමක් සිදු විය නොහැක. සති අන්තයේදී බටහිර රාජ්‍ය

තාන්ත්‍රිකයකු රොයිටර් පුවත් සේවයට මෙසේ ප්‍රකාශ කලේය: "මා සිතන්නේ අප වාඩිවී බලා සිට ඔවුනට (ආන්ඩුවට සහ එල්ටීටීඊයට) මොහොතක් සිතන්නට ඉඩ දිය යුතු බවයි." සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රකාශක තෝර්ෆිනූර් ඔමාර්සන් සමාන අදහසක් ප්‍රකාශ කලේ මෙසේය. "පාර්ශ්වයන්ගෙන් ආරම්භකත්වයක් නොමැතිනම් සටන් නැවැත්වීමට දරන උත්සාහයන් නිශ්ඵලයි......දෙපාර්ශ්වයන්ම ආරම්භකත්වයක් පෙන්වා නෑ."

දිවයිනේ උතුරු සහ නැගෙනහිර සිවිල් වැසියන් ගැඹුරුවන සමාජ ව්‍යසනයකට මුහුන දෙමින් සිටී.

ජාත්‍යන්තර රතු කුරුස සංගමයට අනුව, දහස් සංඛ්‍යාත සරනාගතයින් උතුරු මඩකලපුවේ එල්ටීටීඊ දේශ සීමාවන්ට පිටුපසින් සිරවී සිටී. මුත්තූර් නගරයේ පාලනය අල්ලා ගැනීම සඳහා කෙරුනු දරුනු සටන් හේතුවෙන් පලා ගිය තවත් 40,000 ක් සරනාගතයින් නැගෙනහිර පලාතේ ආන්ඩුව මගින් පාලිත ප්‍රදේශයන්හි සිටින බවට ගනන් බලා ඇත.

යාපන අර්ධද්වීපයේ සටන් ඇරඹීමට පෙර සිකුරාදාවේ, තෙන්මරච්චි, එලුතුමඩුවල්, පුලෝ-පලාලි, කිලාලි, කොඩිකාමම්, කච්චෙයි සහ වරනි ප්‍රදේශයන්හි පිහිටා ඇති හමුදා මුර පොලවල් අසලින් ඉවත්වන ලෙස සිවිල් වැසියනට උපදෙස් දෙන පනිවුඩයක් එල්ටීටීඊය විසින් ගුවන් විදුලියෙන් විකාශය කලේය. කෙසේ නමුදු, එදින සැන්දෑවේ පනවන ලද ඇඳිරි නීතිය මගින් එවන් ඉවත් වීමක් ආරක්ෂක හමුදා විසින් වලකනු ලැබින. කඩ සාප්පු වසා දමන ලෙසද, මහජනතාවට නිවෙස්වල රැඳී සිටින ලෙසද අන කෙරුනු අතර පලා යන්නවුනට වෙඩි තබන බවට ආරක්ෂක හමුදාවෝ තර්ජනය කලහ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ නිවෙස් දෙපසට හුවමාරු කර ගැනෙන වෙඩි ප්‍රහාර වලට කොටු විය. මෑත සතිවල, එල්ටීටීඊය සිවිල් වැසියන් "මිනිස් පලිහ්" ලෙස යොදා ගන්නා බවට චෝදනා කරමින් අහිංසක වැසියන් විශාල ගනනක් මරා දැමුනු දරුනු භූමි සහ ගුවන් ප්‍රහාර සාධාරනීකරනය කරන්නට හමුදාව උත්සාහ කලේය. යාපන අර්ධද්වීපය තුල සිදුවූ සිද්ධියේදී, ආරක්ෂක හමුදාවන් විසින් අත ලග එන එල්ටීටීඊ ප්‍රහාරයක් මන්දෝත්සාහී කිරීම සඳහා ප්‍රාදේශීය දෙමල ජනගහනය තම ප්‍රදේශයන් හැරයාම හිතාමතා වැලැක්වූ බව පෙනී යයි. ආන්ඩුව සහ හමුදාව පැත්තෙන් සලකන කල දිවයිනේ සමස්ත දෙමල සුලුතරය ඔවුනගේ සතුරන් ලෙස දකින අතර ඔවුනට සලකනු ලබන්නේද ඒ අයුරෙනි.

© www.wsws.org